බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, බටහිර මැද පත්තුවේ, කිඹුල්ගොඩ සහ පිටවල්ගොඩ පිහිටි කිඹුල්ගොඩ වත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2002 ඔක්තෝබර් මස 28 දාතම හා අංක 2008 දරන පිඹුරේ නිරූපිත ලොට් 1A වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : කිඹුල්ගොඩවත්තේ ලොට් D ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1986 මැයි 21 දාතම හා අංක 2459 දරන පිඹුරේ ලොට් 7 ද, දකුණට : එකී අංක 2459 පිඹුරේ ලොට් 23 ද සහ බටහිරට : අංක 2459 පිඹුරේ ලොට් 5 ද මායිම් වන එකී අංක 2008 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.75) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියළුම දේ සමග.

ඉහත කී ලොට් A ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රති මිණුමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, බටහිර මැද පත්තුවේ, කිඹුල්ගොඩ සහ පිටවල්ගොඩ පිහිටි කිඹුල්ගොඩවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1986 මැයි 21 දාතම හා අංක 2459 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : කිඹුල්ගොඩවත්තේ ලොට් D ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 7 ද, දකුණට : එම ඉඩමේම ලොට් 23 සහ බටහිරට : එම ඉඩමේම ලොට් 5 ද මායිම් වන ගම්පහ ඉඩම් කාර්යාලයේ E512/253හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2459 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 19.2) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමගය.

එසේම එකී අංක 2459 පිඹුරේ ලොට් 23 සහ බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1979 දෙසැම්බර් මස 25 දාතම හා අංක

1882 දරන පිඹුරේ ලොට් අංක 49 සහ 50 මතින් හා ඔස්සේ ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-136/4

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංක 0005 5002 9820.

2005.01.20 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කැළණිය, දළුගම, ලුම්බිණි පාරේ, අංක 351 හි (දෙදෙනාම) පදිංචි අමරතුංග ආරච්චිගේ ප්‍රේමරත්න පෙරේරා සහ අමරතුංග ආරච්චිගේ ජනිත ලසන්ත පෙරේරා යන අය බන්ධනදායීන් වශයෙන් සහ ඉහත කී කැළණිය, දළුගම, ලුම්බිණි පාරේ, අංක 351 හි එකී අමරතුංග ආරච්චිගේ ප්‍රේමරත්න පෙරේරා යන අය උකස් කරු වශයෙන්ද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2000 ජූනි 21 දාතම සහ අංක 1137 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් ලියා සහතික කළ 2002 ඔක්තෝබර් 04 දාතම හා අංක 645 දරන උකස් බැඳුම්කර මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2004.11.08 වැනි දිනට සීමාසහිත සම්පත් බැංකුවට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත් ලක්ෂ හැත්තෑ හය දහසක (රු.776,000) මුදලක් අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත් ලක්ෂ හැත්තෑ හය දහසක (රු.776,000) සම්පූර්ණ මුදලද, තවත් රුපියල් පන්ලක්ෂ අනූතුන් දහසක (රු.593,000) මුදල සඳහා 2004 නොවැම්බර් 09 දින සිට වෙන්දේසි දින තෙක් වසරකට සියයට විසිතුන (23%) බැගින් තවදුරටත් පොලියද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග අයකර ගැනීම සඳහා එකී අංක 1137 සහ 645 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑකෝරළේ, අධිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා (දලුගම උපකාර්යාල) සීමාව ඇතුලත ඊරියවැටිය ග්‍රාමයේ, ප්‍රා. සභා කොට්ඨාස අංක 3, නාගහවත්ත පාරේ, වරිපනම් අංක 123 (කොටසක්) දරන, දෙල්ගහවත්ත නමින් වැරදියට ලියාපදිංචි කොට ඇති කොස්ගහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1990 අප්‍රේල් 23 දාතම හා අංක 244/1990 දරන පිඹුරේ නිරූපිත ලොට් 3A වශයෙන් ලකුණු කොට දක්වා ඇති ඊසානදිගට ආර්. ඩී. රෝසින් ගේ ලොට් 3 හි ඉතිරි කොටස ද, ගිනිකොනට ලොට් 6 ද නිරිතදිගට ලොට් 4 ද සහ වයඹට නාගහවත්ත පාරද මායිම් වන, කොළඹ ඉඩම් කාර්යාලයේ C635/164 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 244/1990 පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම පහයි බිංදුවක් වන (අක්. 0, රූ. 0, පර්. 3.50) බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. සුදර්ශන්,
සමාගමේ ලේකම්.

03-136/7

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය.

ගිණුම් අංකය - 0004 1001 0089.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.02.26 දින පවත්වන ලද රැස්වීමේදී, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන්, පහත දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

සීමාසහිත සම්පත් බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 1750 හා 1999 ඔක්තෝබර් 08 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බත්තරමුල්ල, උතුරු තලංගම, බණ්ඩාරවත්ත, අංක 16/8 දරන ස්ථානයේ, සෙනෙවිරත්න ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු යන නාමය හා විලාශය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන එකී ජනරජයේ, බත්තරමුල්ල, කොස්වත්ත, උතුරු තලංගම, බණ්ඩාරවත්ත අංක 16/5 දරන ස්ථානයේ, හේවාපේදුරු ආරච්චිගේ ගුණවර්ධන සෙනෙවිරත්න යන අය විසින් එකී බැඳුම්කරයේ බන්ධනදායී වශයෙන් සිටිමින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය මත 2003 නොවැම්බර් 30 වන දිනට රුපියල් හයලක්ෂ හැත්තෑදෙදහස් හාරසීය හැට දෙකකුත් ශත අනූහයක (රු.672,462.96) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හයලක්ෂ හැත්තෑදෙදහස් හාරසීය හැට දෙකකුත් ශත අනූහයක (රු.672,462.96) මුදල සහ 2003 දෙසැම්බර් 01 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් පන්ලක්ෂ අසූ පන්දහස් පන්සිය තිහකුත් ශත දහයක් (රු.585,530.10) සඳහා වර්ෂයකට සියයට විසි එකකුත් දශම හතයි පහ (21.75%) බැගින් වූ වැඩිදුර පොලිය සහ ප්‍රචාරක දැන්වීම් ගාස්තු සහ වෙනත් ගාස්තු ද යන මුදල් ප්‍රමාණ, ඉන් පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ අනුව මුදල අඩු කොට අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 1750 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරය විස්තර කොට ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, බත්තරමුල්ල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, උතුරු තලංගම පිහිටි, මැණික්අගාර දවටගහවත්ත නැමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු පී. ෆීලික්ස් ඩයස් විසින් මැන සාදන ලද අංක 714 හා 1994 ඔක්තෝබර් 09 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක "බී 12 බී" ලෙස ලකුණු කළ, කරුණාතිලක මාවත වරිපනම් අංක 120/12 දරන බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට අංක 149 දරන පිඹුරේ (අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් "බී 14" දරන කට්ටියද, නැගෙනහිරට අංක 149 දරන පිඹුරේ ලොට් "බී 13" දරන කට්ටිය ද, දකුණට ලොට් "1 බී" දරන කට්ටිය ද බස්නාහිරට අංක 714 දරන පිඹුරේ ලොට් "බී 12 ඒ" දරන කට්ටිය ද යන මායිම් ඇතුළත එකී අංක 714 දරන පිඹුර ප්‍රකාර පර්චස් හතකුත් දශම හයයි බින්දුවයි (අ. 0, රූ. 0, පර්. 7.60) ක් විශාලත්වය ඇති බිම් කට්ටිය වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 758/240 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-136/1

---

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක 0042 5000 5690.

2005 ජුනි මස 29 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 13, වාසල පාරේ, 9 වන පටුමග අංක 15 හි පදිංචි අරුණාසලම් ත්‍යාගරාජා යන අය බන්ධන්දායී වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 මැයි 10 දාතම හා අංක 526 දරන උගස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 පෙබරවාරි මස 28 වන දිනට, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත් ලක්ෂ විසි දහස් හාරසිය හැත්තෑ හතරයි ශත තිස් නවයක් (රු. 720,474.39) එකී බැඳුම් කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත් ලක්ෂ විසි දහස් හාරසිය හැත්තෑ හතරයි ශත තිස් නවයක (රු. 720,474.39) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාරලක්ෂ හැට අටදහස් හාරසිය අනූඅටයි ශත හැත්තෑ තුනක (රු. 468,498.73) මුදල සඳහා වසරකට සියයට දාහතයි දශම පහ (17.5%) බැගින්ද, තවත් රුපියල් දෙලක්ෂයක (රු. 200,000) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින්ද 2005 මාර්තු 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 526 දරන බැඳුම් කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උගස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත, නාගරික කොට්ඨාශ අංක 7 නැගෙනහිර කොටහේන, වාසල පාරෙන් හැරී, 9 වන පටුමග දැනට වරිපනම් අංක 15 දරන, වාසල පාරේ, වරිපනම් අංක 168 දරන බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලාලුදීන් විසින් සාදන ලද 1989 ජුනි 21 දාතම හා අංක 1053 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත, කොළඹ ඉඩම් කාර්යාලයේ ඒ 840/272 යටතේ ලියාපදිංචි කර ඇති, උතුරට 9 වන පටුමගද, නැගෙනහිරට 9 වන පටුමග, වරිපනම් අංක 9 දරන පරිශ්‍රයද දකුණට වරිපනම් අංක 43 සහ 45 දරන පරිශ්‍රයන් ද සහ මේෆීල්ඩ් පාරද, සහ බටහිරට 9 වන පටුමග වරිපනම් අංක 21/3 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හයයි හතක් (අක්. 0, රූඩ් 0, පර්. 5.67) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සමග,

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-136/3

---

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක 0046 1000 1056.

2005.12.22 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බණ්ඩාරවෙල, කෙළින් වීදියේ අංක 257 දරන ස්ථානයේ අශෝක් ට්‍රේඩිං කම්පනි යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන එකී ජනරජයේ හපුතලේ, දුම්රිය පළ පාරේ, අංක 56/1 හි පදිංචි වඩිවේල් පුවේන්ද්‍රන් සහ වඩිවේල් හරිදරන් යන දෙදෙනා බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී හපුතලේ, දුම්රිය පළ පාරේ අංක 56/1 හි වඩිවේල් හරිදරන් යන අය උගස්කරු වශයෙන්, බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 සැප්තැම්බර් 16 දාතම හා අංක 11155 දරන උගස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2005 සැප්තැම්බර් 06 වන දිනට රුපියල් අට ලක්ෂ අසූ නම දහස් අටසිය තිස් තුනයි ශත පහක (රු. 889,833.05) මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් අට ලක්ෂ අසූ නව දහස් අටසිය තිස් තුනයි ශත පහක (රු. 889,833.05) සම්පූර්න හිඟ මුදල සමග තවත් රුපියල් දෙලක්ෂ හතලිස් නව දහස් පන්සියයක (රු. 2,49,500) මුදල සඳහා වසරකට සියයට විසි එක (21%) බැගින්ද තවත් රුපියල් පන් ලක්ෂයක (500,000) මුදල සඳහා වසරකට

සියයට විස් දෙක (22%) බැගින්ද 2005 සැප්තැම්බර් 07 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 11155 දරන බැඳුම් කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උගස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මහ පළාත කෝරලේ මැදිකිඳ කොට්ඨාශයේ බණ්ඩාරවෙල නගර සභා සීමාව තුළ බණ්ඩාරවෙල නගරයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. සෙනෙවිරත්න විසින් සාදන ලද 1966 දෙසැම්බර් 18 දාතම හා අංක 243 දරන පිඹුරේ ලොට් 1 සහ 2 ලෙස නිරූපිත, බදුල්ල ඉඩම් කාර්යාලයේ ජේ 125/47 යටතේ ලියා පදිංචි කොට ඇති එකී අංක 243 දරන පිඹුරට අනුව උතුරට ගාමිණී බේකරිය වෙන් කරන වීල්ලද නැගෙනහිරට වරිපනම් අංක 183 දරන ලොට් 3 ද, දකුණට මහා මාර්ගයද සහ බටහිරට වරිපනම් අංක 179 දරන පරිශ්‍රයද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනක් (අක්. 0, රූඩ්. 0 පර්. 3) වන දාව්වෙගෙදරවත්ත නැමැති බෙදා වෙන්කොට සීමා නිර්නය කල සම්පූර්න බිම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල හා අනෙකුත් සියළුම දේ සමග

බලයලත් මිනින්දෝරු එච් . එම්. හේරත් විසින් සාදන ලද 1997 ජූලි 25 දාතම හා අංක 501 දරන මැන මිනුම් පිඹුරට අනුව ඉහත කී ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කොට ඇත.

මහ පළාත කෝරලේ මැදිකිඳ කොට්ඨාශයේ (දැනට බණ්ඩාරවෙල කොට්ඨාශයේ) බණ්ඩාරවෙල නගර සභා සීමාව ඇතුළත අංක 501 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපිත උතුරට ගාමිණී බේකරියට අයත් පරිශ්‍රය වෙන් කරන රූඳවුම් බැම්මද, නැගෙනහිරට කෙලින් වීදියේ වරිපනම් අංක 183 දරන පරිශ්‍රයද, දකුණට බණ්ඩාරවෙල-බදුල්ල මහා මාර්ගයද සහ බටහිරට කෙලින් වීදියේ වරිපනම් අංක 179 දරන පරිශ්‍රයද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම හතක් (අක්. 0, රූඩ් 0, පර්. 2.7) වන දාව්වෙගෙදරවත්ත නැමැති ඉඩමේ බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස, එහි පිහිටි, කෙලින් වීදිය, වරිපනම් අංක 181 දරන ගොඩනැගිල්ල සහ අනෙකුත් සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-136/2

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක 0021 5000 0710.

2005 මාර්තු 24 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුරාධපුර ගුවන්තොටුපල පාරේ අංක 581/111 හි පදිංචි ජයතිලකගේ නිශාන්ත ලාල් ජයතිලක යන අය බන්ධනදායී වශයෙන් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 පෙබරවාරි 18 දාතම හා අංක 2368 දරන උගස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2004 මාර්තු මස 31 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන් ලක්ෂ හැත්තෑහය දහස් දෙසිය අනූ තුනයි ශත විසි දෙකක (376,293.22) හිඟ මුදල් ප්‍රමාණයක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හය දහස් දෙසිය අනූ තුනයි ශත විසි දෙකක (රු. 376,293.22) ක සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් තුන් ලක්ෂ විසි දෙදහස් අටසිය හැටක (රු. 322,860) ක මුදල සඳහා වසරකට සියයට විසිහතර(24%) බැගින් 2004 අප්‍රේල් 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2368 දරන බැඳුම් කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උගස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංක 293 පන්ඩුලගම කොරකහවැව පිහිටි මැද ඉඩම නමැති අනුරාධපුර ඉඩම් කාර්යාලයේ එල්. ඩී ඕ. 370/99 හි ලියාපදිංචි කොට ඇති උතුරට පී. හවඩියාගේ කුඹුරද, නැගෙනහිරට ගල්හේනේ කුඹුරද, දකුණට පී. ජයතිලකගේ උස් ඉඩමද, බටහිරට හල්මිල්ලකුලම මාර්ග රක්ෂිතයද, මායිම් වන ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 02, රූඩ්. 0, පර්.0) වන රජයේ ඉඩම් කොටස එහි ඇති වගාවන් සහ අනෙකුත් සියළුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-136/9

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0021 5000 0710.

2005 මාර්තු 24 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුරාධපුර පන්ඩුලගම, පුත්තලම් පාරේ අංක 11/ඩී හි (දෙදෙනාම) පදිංචි පුංචිරාලගේ ජයතිලක

සහ ජයතිලකගේ නිශාන්ත ලාල් ජයතිලක යන අය බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී අනුරාධපුර පන්ඩුලගම, පුත්තලම් පාරේ අංක 11/ඩී හි පුංචිරාලගේ ජයතිලක යන උකස්කරු වශයෙන්ද, අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 ජනවාරි 29 දාතම හා අංක 2118 දරන උගස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2004 මාර්තු මස 31 වන දිනට එකී බැඳුම්කරය මත රුපියල් හත් ලක්ෂ හතලිස් පන්දහස් එකසිය හතලිස් තුනයි ශත තිස්තුනක (රු. 745,143.33) මුදල් ප්‍රමාණයක් සීමාසහිත සම්පත් බැංකුවට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත් ලක්ෂ හතලිස් පන්දහස් එකසිය හතලිස් තුනයි ශත තිස් තුනක (රු. 745,143.33) සම්පූර්ණ හිඟ මුදල සහ රුපියල් තුන් ලක්ෂ පනස් දහසක (රු. 350,000) මුදල සඳහා වසරකට සියයට විසිහතර(24%) බැගින් 2004 අප්‍රේල් 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2118 දරන බැඳුම් කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නුවරගම් කෝරළේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංක 293, පන්ඩුලගම, කොරකහවැව පිහිටි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිනිය විසින් පිරිනමන ලද 1999 ජුනි 16 දාතම හා අංක Anu/Manupa/Pra/2750 දරන ප්‍රතිපාදන ඔප්පුවේ විස්තර කොට ඇති උතුරට, පුත්තලම් පාර රක්ෂිතය ද, නැගෙනහිරට මාටින් සිඤ්ඤෝ ගේ ඉඩම ද, දකුණට පාර සඳහා වෙන් කළ කොටසද සහ බටහිරට ජයමහගේ ඉඩමද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අක්.0, රූඩ් 2, පර්. 0) රජයේ ඉඩම් කොටස එහි පිහිටි සෑම සියළු දේ සමග,

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශයේ, නුවරගම් කෝරළේ, ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංක 293 පණ්ඩුලගම ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, කොරකහවැව පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2000 ඔක්තෝබර් 29 දාතම හා අංක 3590 දරන පිඹුරේ මැතකදී කළ මිනුමකට අනුව 1999 ජුනි 16 දාතම හා L.D.O ප්‍රතිපාදන Anu/Manupa/Pra/2750 හි විස්තර කෙරෙන ගොඩ ඉඩම නැමැති ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති උතුරට : පාර ඔස්සේ රක්ෂිතය ද, නැගෙනහිරට : මාටින් සිඤ්ඤෝ ගේ ඉඩම ද, දකුණට : රජයේ ඉඩමද සහ බටහිරට : ජයමහගේ ඉඩමද මායිම් වන අනුරාධපුර ඉඩම් කාර්යාලයේ L.D.O 370/201 යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අක්. 0, රූඩ්. 2, පර්. 0 ) වන ඉඩම එහි පිහිටි සෑම සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-136/8

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2000.08.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වසන්ත ධම්මික ගමආරච්චි මහතා විසින් සහතික කරන ලද 1996.04.26 දින අංක 71 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ලෝලුවාගොඩ කදන්ගමුව හි පදිංචි වික්‍රමසිංහ ආරච්චිගේ වින්සන් වික්‍රමසිංහ සහ ජයසේකර අධිකාරි අප්පුහාමිලාගේ චම්පා කුමාරි යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් දහසක (රු. 240,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 1997.12.30 දින සිට 28% බැගින් රුපියල් දෙලක්ෂ හතලිස් දහසක (රු. 240,000) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් දෙලක්ෂ හතලිස් දහසක (රු. 240,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. විජේරත්න මහතා විසින් සහතික කරන ලද 1997.04.03 දින අංක 127 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ලෝලුවාගොඩ, කදන්ගමුව හි පදිංචි වික්‍රමසිංහ ආරච්චිගේ වින්සන් වික්‍රමසිංහ සහ ජයසේකර අධිකාරි අප්පුහාමිලාගේ චම්පා කුමාරි යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්දහසක (රු. 250,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 1997.04.04 දින සිට 28% බැගින් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 250,000) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 250,000) මුදලක් අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 71 සහ 127 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

## දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ හාපිටිගම කෝරළයේ උඩුගහපත්තුවේ කදන්ගමුවේ පිහිටි කැන්දහේන නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටිකිරි බණ්ඩා තෙන්නකෝන් මහතා විසින් 1969.07.22 දින මැන සාදන ලද අංක 309 දරන පිඹුරෙහි ලොට් අංක 01 දරන ඉඩමට මායිම්, උතුරට : ඒ. ඊ. අමරතුංගට අයිති ඉඩමද, නැගෙනහිරට : පන්සල් වත්තද, දකුණට : අංක 309 දරන පිඹුරේ කැබලි අංක 02 ද, බස්නාහිරට : පී. ඩබ්. ඩී පාරද යන මෙකී මායිම් තුල වූ පර්චස් දහසයයි දශම එකක් (අක්.0, රූ.00 පර්. 16.1) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේද සමඟ වේ. (එෆ් 210/73 - මීගමුව)

ඉහත කී කැන්දහේන නැමැති ඉඩමෙන් කොටසකට ටී. බී. තෙන්නකෝන් මහතා විසින් 1969.07.22 දින මැන සාදන ලද අංක 309 දරන පිඹුරෙහි ලොට් අංක 02 දරන ඉඩමට මායිම්, උතුරට : අංක 01 දරන කොටසද, නැගෙනහිරට : කිරුලබිම් සහ දේවාලයට අයිති ඉඩම යැයි සඳහන්ව ඇතත් එසේ නොව දැනට පන්සලට අයිති ඉඩම ද, දකුණට : කැබලි අංක 03 ද, බස්නාහිරට : පස්යාල ගිරිඋල්ල මහ පාරද යන මෙකී මායිම් තුල වූ පර්චස් දහඅට

(අ. 0, රූ. 0, පර්. 18) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගසකොල, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියළු දේද සමග වේ. (එෆ්. 202/195-මීගමුව)

බලෙන් විකිණිය හැකි මිල රු. 100,000.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03,
වත්හිමි පාර,
කුරුණෑගල.

03-156

---

## මහජන බැංකුව - පොලොන්නරුව නගර (232) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.12.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් නිවේදනය කරනු ලැබේ.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් පද්මිණී අත්තනායක මහත්මිය විසින් සහතික කරන ලද 2000.10.05 දිනැති අංක 238 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, පුංචි හේවගේ ආනන්ද මයා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හයලක්ෂ තිස් දහස (රු. 630,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2005.10.29 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් හයලක්ෂ තිස් දහස (රු. 630,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ තිස් දහසක (රු. 630,000) ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 238 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙනදේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැද පත්තුවේ,, 72බී අලුත්වැව ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ, උඩවෙලගම නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ.ජ.පි.පො. 17 දරන පිඹුරේ අංක 212 දරන බිම් කැබැල්ලෙන් කොටසක් බෙදා වෙන් කරමින්, බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ මහතා විසින් 1997.03.14 සාදන ලද අංක 1298ඒ දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩමට මායිම්, උතුරට : එෆ්.සී.පී.පො. 17 දරන පිඹුරේ ලොට් අංක 208 ද, නැගෙනහිරට : එෆ්.සී.පී.පො. 17 දරන පිඹුරේ ලොට් අංක 204 න් පෙන්නුම් කරන මාර්ගය ද, දකුණට : වර්ෂ 1996 ක්වූ දෙසැම්බර් මස 01 වන දින ඉහත කී මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1298 දරන පිඹුරේ ලොට් අංක 01 න් පෙන්නුම් කෙරෙන එම්. එම්. දයානන්ද ට අයත් දේපල ද, බස්නාහිරට : ඉහත කී 1298 දරන පිඹුරේ ලොට් අංක 01 න් පෙන්නුම් කෙරෙන එම්. එම්. දයානන්ද ට අයත් දේපල, ලොට් අංක 02 න් පෙන්නුම් කෙරෙන එම්. එම්. ගැමුණුට අයත් දේපල සහ ලොට් අංක 03 න් පෙන්නුම් කෙරෙන එම්. එම්. ශ්‍රියානන්ද වේරකෝට අයත් දේපල ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක්, (අ. 00, රූ. 02, පර්. 00) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල්ඩීඕ 8/2494 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
උතුරු මැද කලාපය.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නවනගරය,
පොළොන්නරුව.

දුරකථන අංක : 027-2224404, 2225760, 2223900, 2223522
ෆැක්ස් : 027-2223522
ඊ-මේල් : pol@rho.peoplesbank.lk

03-158

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2006.05.18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ඇපා කංකානම්ගේ ප්‍රේමසිරි මහතාගේ ණය වගකීම සඳහා උකස් කළ දේපල

1. එකී අංක 4422 සහ 4423 දරන බැඳුම්කර මත ණය හා අයිරා මත මුල් මුදල හා 2006.04.30 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය පනස් අටයි ශත අනූනවයක (රු. 1,36,43,358.99) මුදලක් සමඟ රුපියල් විසිනව ලක්ෂ දොළොස් දහස් පන්සියයක (රු. 29,12,500) මුදලක් මත වසරකට සියයට දහතුනයි දශම එකයි එකක (13.11%) බැගින් ද, රුපියල් හතලිස් පන්ලක්ෂ විසිහත් දහස් පන්සිය අසූහතයි ශත දහනවයක (රු. 45,27,587.19) මුදලක් මත වසරකට සියයට දාසය (16%) බැගින් ද, රුපියල් තිස්ලක්ෂයක (රු. 30,00,000) මුදලක් මත වසරකට සියයට පහලොවයි දශම පහ (15.5%) බැගින් පොළියක්, 2006.05.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මාකොළ, මාකොළ උතුරු ජාතික තරුණ සභා පාර, අංක 472/24හි පදිංචි ඇපා කංකානම්ගේ ප්‍රේමසිරි මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 4422 සහ 4423 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය පනස් අටයි ශත අනූනවයක (රු. 1,36,43,358.99) මුදල සමග 2006.05.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්

කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීමේ- ශාඛා) ට ද, මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

දේපළ 1

## පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, දෙල්ගොඩ (දැන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) බියගම ප්‍රාදේශීය කාර්යාලීය සීමාවේ මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1991.11.27 සහ 1991.11.12 දිනැති අංක 1065 දරන පිඹුරේ ලොට් 11 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 10 ද, නැගෙනහිරට : ලොට් ආර් 1 ද, දකුණට : ලොට් 23 ද, බස්නාහිරට : කලින් ඩී. එස්. වික්‍රමසිංහට අයිති හෙයියන්තුඩුව එස්ටේට් ද මායිම්ව එකී අංක 1065 දරන පිඹුර අනුව පර්චස් 20 ක (පර්. 20) ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී612/19හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, දෙල්ගොඩ මහ කොළඹ ආර්ථික කොමිෂමේ, බියගම ප්‍රාදේශීය කාර්යාල සීමාවේ මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් (දැන් ෆිනෑන්ස් කම්පනිවත්ත යනුවෙන් හඳුන්වන) නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1991.11.27 සහ 1991.11.12 දිනැති අංක 1065 දරන මිණුම් පිඹුරේ විස්තර කළ ලොට් 24 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 23 ද, නැගෙනහිරට : ලොට් ආර් 1 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කළ) දකුණට : ලොට් 25 ද, බස්නාහිරට : කලින් ඩී. ඩබ්. එස්. වික්‍රමසිංහගේ හෙයියන්තුඩුව එස්ටේට්හි කොටසක් ද මායිම්ව එකී අංක 1065 දරන පිඹුර අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 431/87හි ලියාපදිංචි කර ඇත.

## දෙවන උපලේඛනය (වෙන් කළ පාර)

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, දෙල්ගොඩ (දැන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) බියගම ප්‍රාදේශීය කාර්යාලීය සීමාවේ මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1991.11.27 සහ 1991.11.12 දිනැති අංක 1065 දරන පිඹුරේ විස්තර කල ලොට් ආර්3(අඩි 15ක් පළල වෙන්කළ පාර) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් ආර් 1 ද, නැගෙනහිරට : ලොට් ආර් 33 ද, දකුණට : ලොට් 71 ද, බස්නාහිරට : ලොට් 34 ද මායිම්ව එකී අංක 1065 දරන පිඹුර අනුව පර්චස් තුනයි දශම එකක (අ 0, රූ. 0, පර්. 3.1) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 512/162හි ලියාපදිංචි කර ඇත.

එකී මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් (දැන් ෆිනෑන්ස් කම්පනිවත්ත) නමැති ඉඩම එකී අංක 1065 දරන පිඹුරේ විස්තර කළ ලොට් ආර් 4 වශයෙන් සඳහන් (අඩි 30ක් පළල පාර සඳහා වෙන්කළ) බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට එකී අංක 1069 දරන පිඹුරේ ලොට් 1බී ද, නැගෙනහිරට එකී අංක 101 දරන පිඹුරේ ලොට් 2 ද, දකුණට එකී අංක 101 දරන පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට ලොට් 30, ආර් 1, 29, 18, 17, 16, 61, 5බී සහ 5ඒ ද, මායිම්ව එකී අංක 1065 දරන පිඹුර අනුව පර්චස් එකොළහයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 11.6) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 474/243හි ලියාපදිංචි කර ඇත.

එකී මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් (දැන් ෆිනෑන්ස් කම්පනිවත්ත) නමැති ඉඩම එකී අංක 1065 දරන පිඹුරේ විස්තර කළ ලොට් ආර් 1 (අඩි 20ක් පළල වෙන්කළ පාර) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට ලොට් 1-4, 5 බී 26-29 සහ ආර් 2 ද, නැගෙනහිරට ලොට් ආර් 4, 9, 12, 22 සහ 26 ද, දකුණට ලොට් 6-6, ආර් 2, 30-33 සහ ආර් 3 ද, බස්නාහිරට ලොට් 34, 25, 24, 23, 11 සහ 10 ද මායිම්ව එකී අංක 1065 දරන පිඹුර අනුව රූඩ් එකයි, පර්චස් විසි නවයයි දශම දෙකක (අ. 0, රූ. 1, පර්. 29.2) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී464/257හි ලියාපදිංචි කර ඇත.

එකී මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ජී. පණ්ඩිතරත්න විසින් සාදන ලද 1960.05.30 දිනැති අංක 101 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 (පොදු පාරක් සඳහා වෙන්කළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට මාකොළ සිට හෙයියන්තුඩුව දක්වා ගම්සභා පාර ද, නැගෙනහිරට දෙල්ගහවත්ත සහ මෙම ඉඩමේ ලොට් 5 ද, දකුණට මෙම ඉඩමේ ලොට් 2 වශයෙන් සඳහන් පුද්ගලික පාර ද, බස්නාහිරට දෙල්ගහවත්ත ද, මෙම ඉඩමේ ලොට් 4 සහ අගෝරිස් අප්පුට අයිති මෙම ඉඩමේ ලොට් 3 ද, මායිම්ව එකී අංක 101 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 14.5) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීම් කාර්යාලයේ සී512/236හි ලියාපදිංචි කර ඇත.

එකී මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. එස්. පණ්ඩිතරත්න විසින් සාදන ලද 1960.05.30 දිනැති අංක 101 දරන පිඹුරේ විස්තර කළ ලොට් 2 (පොදු පාරක් සඳහා වෙන්කළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට මෙම ඉඩමේ ලොට් 1 වශයෙන් සඳහන් පොදු පාර ද, නැගෙනහිරට මෙම ඉඩමේ ලොට් 5 ද, දකුණට මෙම ඉඩමේ ලොට් 10 ද, බස්නාහිරට මෙම ඉඩමේ ලොට් 4 ද, මායිම්ව එකී අංක 101 දරන පිඹුර අනුව රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 602/12හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, දෙල්ගොඩ (දැන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) බියගම ප්‍රාදේශීය කාර්යාල සීමාවේ මාකොළ දකුණ සහ හෙයියන්තුඩුව ග්‍රාමයන්හි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1991.11.27 සහ 1991.11.12 දිනැති අංක 1065 දරන පිඹුරේ විස්තර කරන ලද ලොට් 72 (පාර සඳහා වෙන්කළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට ශ්‍රී පැරකුම්බා මාවත කැබැල්ල ද, නැගෙනහිරට පාර ද, දකුණට ලොටේ ආර් 4 ද, බස්නාහිරට අංක 1069 දරන පිඹුරේට 1ඒ ද, මායිම් එකී අංක 1065 දරන පිඹුර අනුව පර්චස් දෙකයි දශම එකක (අ. 0, රූ. 0, පර්. 2.1) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 506/238හි ලියාපදිංචි කර ඇත.

දේපළ I

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ, උඩපත්තු දකුණේ වලන්දුර හි පිහිටි අලුපොතදෙණිය එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1947.12.29 දිනැති අංක 20 දරන පිඹුරේ විස්තර කළ ලොට් ඩී වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට එකී අංක 20 දරන පිඹුරේ ලොට් ඒ ද, නැගෙනහිරට එකී අංක 20 දරන පිඹුරේ ලොට් බී සහ බලයලත් මිනින්දෝරු ටී. රෝ. පීරිස් විසින් සාදන ලද 1918.03.27 දිනැති අංක 236 දරන පිඹුරේ ලොට් 7 ද, දකුණට සහ බස්නාහිරට අලුපොත්දෙණිය ඇල ද, මායිම්ව එකී අංක 20 දරන පිඹුර අනුව අක්කර දහයක (අ. 10, රූ. 0, පර්. 0) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ726/216හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම මැත මිනුමට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ, උඩපත්තු දකුණේ, වලන්දූරේ ග්‍රාමයේ පිහිටියාවූ ද, (බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1947.12.29 දිනැති අංක 20 දරන පිඹුරේ විස්තර කළ නැවත මිණුමක් වූ ලොට් ඩී) අලුපොත්දෙණිය එස්ටේට් (කොටස) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. වෙලගෙදර විසින් සාදන ලද 2000.10.30 දිනැති අංක 2972 දරන පිඹුරේ විස්තර කළ ලොට් 5 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට අංක 20 දරන පිඹුරේ විස්තර කළ ඒ වශයෙන් සඳහන් ඉඩම සහ එකී පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට මෙම පිඹුරේ ලොට් 1 සහ අංක 236 දරන පිඹුරේ ලොට් 7 (හික්ගහවත්තේ කොටසක් සහ නුගේලහවත්තේ කොටසක්) ද, දකුණට අංක 236 පිඹුරේ ලොට් 7 හික්ගහවත්තේ කොටසක් නුගේලහවත්තේ කොටසක් සහ අලුපොත්දෙණිය ඇල, බස්නාහිරට අලුපොත්දෙණිය ඇල ද, මායිම්ව අක්කර නවයයි, රූඩ් එකයි, පර්චස් දහඅටයි දශම හයක (අ. 9, රූ. 1, පර්. 18.6) හෙක්ටයාර් තුනයි දශම හතයි නවයයි බිංදුවයි බිංදුවක (හෙක්. 3.7900) ප්‍රමාණයෙන් යුක්ත වේ.

2. එකී වලන්දූරේ හි පිහිටියාවූ ද, අලුපොත්දෙණිය එස්ටේට් නමැති ඉඩම එකී අංක 20 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට පරගහතැන්නෙමූකලාන ද, නැගෙනහිරට අංක 20 දරන පිඹුරේ ලොට් සී ද, දකුණට අංක 236 දරන පිඹුරේ ලොට් 7 ද, බස්නාහිරට එකී අංක 20 දරන පිඹුරේ ලොට් ඩී සහ ඒ ද, මායිම්ව එකී අංක 20 දරන පිඹුර අනුව අක්කර දහයක (අ. 10, රූ. 0, පර්. 0) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ726/217හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් මැත මිනුමට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ උඩපත්තු දකුණේ, වලන්දූර ග්‍රාමයේ පිහිටියාවූ ද (බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1947.12.29 දිනැති අංක 20 දරන පිඹුරේ විස්තර කළ නැවත මනින ලද්දාවූ කොටසේ ලොට් බී) අලුපොත්දෙණිය එස්ටේට් (කොටසක්) නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. වෙලෙගෙදර විසින් සාදන ලද 2000.10.30 දිනැති අංක 2972 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට ලොට් 2 වශයෙන් සඳහන් (පාර) ඉඩම ද, නැගෙනහිරට අංක 2972 දරන එකී පිඹුරේ ලොට් 2 සහ ලොට් 3 ද, දකුණට පිඹුරේ ලොට් 3 සහ අංක 236 දරන පිඹුරේ ලොට් 7 හා හික්ගහවත්ත සහ නුගේලහවත්තේ කොටසක් සහ මෙම පිඹුරේ ලොට් 5 ද, බස්නාහිරට අංක 20 දරන පිඹුරේ ලොට් 5 සහ ලොට් ඒ සහ මෙම පිඹුරේ ලොට් 2 (වෙන්කළ පාර) ද, මායිම්ව අක්කර නවයයි, රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම එකක (අ. 9, රූ. 2, පර්. 02.1) හෝ හෙක්ටයාර් 3.8495කින් යුක්ත වේ.

### දෙවෙනි උපලේඛනය (වෙන්කළ පාර)

එකී වලන්දූර ග්‍රාමයේ පිහිටියාවූ ද, (ඉහත වඩා සම්පූර්ණ ලෙස විස්තර කළ අංක 20 දරන පිඹුරේ නැවත මනින ලද්දාවූ උප බෙදුමේ කොටසක් වූ ලොට් බී) අලුපොත්දෙණිය එස්ටේට් නැමැති ඉඩම එකී අංක 2972 දරන පිඹුරේ විස්තර කළ ලොට් 2 වශයෙන් සඳහන් (පාරක් සඳහා වෙන්කළ) ඉඩම් කැබැල්ල උතුරට අංක 20 දරන පිඹුරේ ලොට් ඒ සහ රජයට අයිති පේරගහතැන්න මූකලාන ඉඩම ද, නැගෙනහිරට රජයට අයිති පේරගහතැන්න මූකලාන නමැති ඉඩම සහ එකී පිඹුරේ ලොට් 1 ද, දකුණට ලොට් 3 සහ 1 ද, බස්නාහිරට ලොට් 1 සහ අංක 20 දරන පිඹුරේ ලොට් ඒ ද, මායිම්ව රූඩ් එකයි, පර්චස් විසිහතයි දශම දෙකක (අ. 0, රූ. 1, පර්. 27.2) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හතයි බිංදුවයි බිංදුවක (හෙක්. 0.1700) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 726/218හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ/අනුමැතිය පරිදි,

එම්. ඒ. ජී. කරුණාරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
(අයකර ගැනීම්-ශාඛා)

ලංකා බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 04, ලංකා බැංකු මාවත,
කොළඹ 01

03-127

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩි කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ධශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයඛ පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ | | තැපැල් ගාස්තුව (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2007**

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු | 2007.03.02 | සිකුරාදා | 2007.02.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.03.09 | සිකුරාදා | 2007.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.16 | සිකුරාදා | 2007.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.23 | සිකුරාදා | 2007.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.30 | සිකුරාදා | 2007.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2007.04.05 | බ්‍රහස්පතින්දා | 2006.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.12 | බ්‍රහස්පතින්දා | 2006.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.20 | සිකුරාදා | 2007.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.04.27 | සිකුරාදා | 2007.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මැයි | 2007.05.04 | සිකුරාදා | 2007.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.11 | සිකුරාදා | 2007.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.18 | සිකුරාදා | 2007.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.25 | සිකුරාදා | 2007.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.